**දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2015**

දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 4.05 වගන්තියේ IV ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දකුණු අධිවේගී මාර්ගයට සම්බන්ධ වන මාර්ග කිලෝමීටර් 32 ක් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම මඟින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,893 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,670 කට සමාන එජඩො මිලියන 75 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කරන ලද අතර 2018 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

### 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩුව

ව්‍යාපෘතියේ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වෙනත් ප්‍රදාන අරමුදල් සපයන ව්‍යාපෘති 02 ක් ද පරිපාලනය කරනු ලැබේ. මෙම ව්‍යාපෘති තුනම සඳහා දරන ලද රු.මිලියන 3.64 ක්වූ පොදු කාර්ය පිරිවැය සාධාරණ පදනමකට සමානුපාතිකව පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියට අයකර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 75* | 9,670 | 644.00 | 2.59 | 419.41 | 3.38 | 523.04 |
| ශ්‍රී ලං ර | 25 | 3,223 | 466.86 | 3.29 | 466.78 | 3.30 | 468.06 |
| | 100 | 12,893 | 1,110.86 | 5.88 | 886.19 | 6.68 | 991.10 |

* ලැබුණු තොරතුරු අනුව, එජඩො මිලියන 5 ක වෙන්කිරීමක් ණය අංක 3028 එස්ආර්අයි යටතේ මෙහෙයවන ව්‍යාපෘතියට මාරු කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, පුනරුත්ථාපන වැඩවලින් සියයට 55 ක් 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, මොරටුව - පිළියන්දල මාර්ගයේ හා රත්මලාන - මිරිහාන මාර්ගයේ කිලෝමීටර් 4.64 ක් එනම් පුනරුත්ථාපන වැඩවලින් සියයට 41 ක් පමණක් එදිනට නිම කර තිබුණි. තවද මොරටුව - පිළියන්දල මාර්ගයේ විදුලිබල රැහැන් වෙනත් තැනකට ස්ථානගත කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට රු.මිලියන 15.77 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම කාර්යයන් 2016 අප්‍රේල් 30 වන විටත් නිම කර නොතිබුණි.

(ආ) කිරුළපන - ගොඩගම මාර්ගය හා කැස්බෑව - පොකුණුවිට මාර්ගයේ කිලෝමීටර් 16.18 ක සහ දකුණු අධිවේගී මාර්ගයේ සිට මාදුරුගොඩ දක්වා කිලෝමීටර් 10.37 ක පුනරුත්ථාපන වැඩ 2016 ජුනි 30 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම 2015 දෙසැම්බර් 31 දක්වා ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 16.16 ක් වූ බැඳීම් හා පොලී ගාස්තු සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලන අවශ්‍යතාවයන් අනුව, පුනරුත්ථාපන වැඩ ආරම්භ කර දින 60 ක් ඇතුළත තත්ත්ව සහතික කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරු විසින් රසායනාගාර ස්ථාපිත කළ යුතුය. කෙසේ වුවද විගණකවරුන් විසින් 2015 නොවැම්බර් 16 දින විගණකවරුන් විසින් කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී, මොරටුව - පිළියන්දල මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ස්ථාපිත කරන ලද රසායනාගාරය අවශ්‍ය පරීක්ෂණ උපකරණ වලින් සමන්විතව නොතිබූ බව අනාවරණය විය. තවද කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කරන ලද

"ඉලෙක්ට්‍රික් තමෝටීටරය" (Electric Thermometer) හා "මාර්ෂල් රින්ග්" (Marshall Ring) සඳහා අවශ්‍ය කාල ක්‍රමාංකනය කර නොතිබූ බවද නිරීක්ෂණය විය.

(ආ) කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල 4.9 වගන්තිය අනුව, කොන්ත්‍රාත්තුව ආරම්භ කර දින 28 ක් ඇතුළත කොන්ත්‍රාත්කරු විසින් ISO 9000:2000 ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා තත්ත්ව කළමනාකරණ සහතික පද්ධතියේ (Quality Management Assurances System) දෘඩාංග පිටපත් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තත්ත්ව සහතික සැලැස්මක් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) ලැබුණු තොරතුරු අනුව, උපදේශක කාර්ය මණ්ඩලයේ හිමිකම් ඉල්ලීම් විශේෂඥ (Claim Specialist) ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක (Senior Quantity Surveyor) යන ප්‍රධාන තනතුරු 2015 අගෝස්තු 15 දක්වා පුරප්පාඩු වී පැවතුණු අතර, මාර්ග පුනරුත්ථාපන කාර්යයන්වල අධීක්ෂණ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබූ බව ඒ අනුව නිරීක්ෂණය විය. උපදේශක සේවා ගිවිසුමේ අංක 4.4 (III) වගන්තිය අනුව, හිමිකම් ඉල්ලීම් විශේෂඥ විසින් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද සහතික බැඳුම්කර හා රක්ෂණ හිමිකම්, සමාලෝචනය කළ යුතුය. කෙසේ වුවද මාර්ග පුනරුත්ථාපන කාර්යයන් සඳහා රක්ෂණ ආවරණ, ඇප බැඳුම්කර ආදිය සඳහා 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 12.55 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. තවද උපදේශක සේවා ගිවිසුමේ අංක 4.4 (III) වගන්තිය ප්‍රකාරව ප්‍රමාණ සමීක්ෂක විසින් නිර්දේශ කිරීමෙන් තොරව අතුරු ගෙවීම් සහතික 04 ක් මත රු.මිලියන 89.28 ක මුදලක් ගෙවා තිබුණි.

**3.4 මූල්‍ය සම්මුතීන්වලට අනුකූල නොවීම**

කොන්ත්‍රාත් කොන්දේසිවල 6.1 වගන්තිය අනුව, මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා ස්ත්‍රී සහභාගීත්වය අවම වශයෙන් සියයට 20 ක් බවට තහවුරු කර ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ තොරතුරු කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. ප්‍රගති වාර්තා වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට පුනරුත්ථාපන වැඩ සඳහා ස්ත්‍රී සහභාගීත්වය සියයට 6.5 ක් පමණක් ලෙස වාර්තා විය.